සියලු ම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## தென் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education, Southern Province

45 | S | I

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - දෙවන වාර පරීක්ෂණය - 2019 මාර්තු**

**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை - இரண்டாம் தவணைப் பரீட்சை - 2019 மார்ச்**

**General Certificate of Education (Adv. Level) - Second Term Test - March 2019**

**13 ශ්‍රේණිය**
**Grade 13**

**බෞද්ධ ශිෂ්ටාචාරය - I**
**Buddhist Civilization - I**

**පැය දෙකයි**
**Two hours**

**සැලකිය යුතුයි :**

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ අංකය ලියන්න.**
- **උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් සැලකිල්ලෙන් කියවා පිළි පදින්න.**

* **01 සිට 50 තෙක් වූ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති 1, 2, 3, 4, 5 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (x) යොදා දක්වන්න.**

(01) භාරතීය සමාජයේ බ්‍රාහ්මණයන් විසින් විවිධ සංකල්ප හඳුන්වා දුන් අතර 'බ්‍රහ්ම සහව්‍යතාවය' සඳහා ඇති එකම මාර්ගය ලෙස සඳහන් කළේ,

1. ස්වධර්ම අනුගමනය කිරීමයි.
2. ආපද්ධර්ම අනුගමනය කිරීමයි.
3. යාගය අනුගමනය කිරීමයි
4. කාම සුඛල්ලිකානු යෝගය අනුගමනය කිරීමයි.
5. වේදය අධ්‍යයනය කිරීමයි.

(02) බ්‍රාහ්මණ ඉගැන්වීම්වලට අනුව ප්‍රජාරක්ෂණය ඉගෙනීම, දන්දීම, යාග කිරීම ආදී කාර්යයන් සිදු කිරීමට පවරා තිබුණේ,

1. බ්‍රාහ්මණ වර්ණයටය.
2. ක්ෂත්‍රිය වර්ණයටය .
3. වෛශ්‍ය වර්ණයටය.
4. ශූද්‍ර වර්ණයටය.
5. අනාර්ය සාමාජිකයන්ටය.

(03) ශ්‍රමණ ගුරුකුල පිළිබඳව තොරතුරු සෙවීමේ දී විවිධ ශ්‍රමණ සාමාජිකයන් අතර විශේෂතා හඳුනා ගත හැකිය. ඒ අනුව ''අතින් දණ්ඩක්දරා සිටි. අන්තකිලමථානුයෝගී ව උග්‍ර තපස්ව්‍රත අනුගමනය කරනු ලැබුවේ,

1. නිගණ්ඨයන්ය.
2. ජටිලයන්ය.
3. පරිබ්‍රාජකයන්ය.
4. ආජීවකයන්ය.
5. බ්‍රාහ්මණයන්ය.

(04) මහජනයා වික්ෂිප්තියට පත්වන අයුරින් අමරා වික්ඛේපවාදය නමින් හඳුන්වා ඇති දර්ශනයක් ඉදිරිපත් කළ බුද්ධකාලීන ශාස්තෘවරයකු වූයේ,

1. සංජය බෙල්ලට්ඨිපුත්තය.
2. පකුධ කච්චායනය.
3. අජිත කේස කම්බලිය
4. මක්ඛලි ගෝසාලය.
5. පූර්ණ කස්සපය.

(05) ස්වාමියා මිය ගිය පසු බිරිඳ ජීවත් වන්නේ නම් කිළිටි වස්ත්‍ර හැඳ රසවත් ආහාර පානාදියෙන් වැලකී කිසිදු ආභරණයක් නොපැළඳ සිය ස්වාමියාම පතමින් දාසියක වශයෙන් විසිය යුතු බව බමුණන්ගේ මතය විය. එසේ කටුක ජීවිතයත් ගත කිරීමේ චාරිත්‍රය හඳුන්වන්නේ,

1. පර්ධාචාරිත්‍රය නමිනි.
2. සතිපූජාව නමිනි.
3. ශ්‍රාද්ධ යාගය නමිනි.
4. පුංසවනය නමිනි
5. ගෘහචාරිත්‍ර නමිනි .

(06) මහා බ්‍රහ්මයා විසින් මනුෂ්‍ය වර්ගයා වර්ණ හතරකට බෙදා මවන ලද බව වෛදික ග්‍රන්ථවල සඳහන් වේ. එම මතය යොදා ගනිමින් බමුණන් විවිධ අරමුණු ඉටුකර ගැනීමට යොමු විය. ඒ අනුව ඔවුන් තුළ පැවති ප්‍රධානතම අභිමතාර්ථය වූයේ,

1. අධ්‍යාපන අයිතිය රැක ගැනීමයි.
2. ආර්ථික අයිතිය රැක ගැනීමයි .
3. සාමාජික අයිතිය රැක ගැනීමයි.
4. දේශපාලන අයිතිය රැක ගැනීමයි .
5. පූජක අයිතිය රැක ගැනීමයි.

(07) ආපද්ධර්ම පිළිබඳ බ්‍රාහ්මණ නිර්වචන අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. ක්ෂත්‍රියා විසින් වෛශ්‍යයාට අයත් කටයුතු කළ හැකිය යන්නයි.
2. ක්ෂත්‍රියා විසින් බ්‍රාහ්මණයාට අයත් කටයුතු කළ හැකිය යන්නයි.
3. ක්ෂත්‍රියයා විසින් වෛශ්‍යයාට අයත් කටයුතු කළ නොහැකිය යන්නයි.
4. ශුද්‍රයා විසින් වෛශ්‍යයාට අයත් කටයුතු කළ හැකිය යන්නයි.
5. වෛශ්‍යයාට ඕනෑම කටයුත්තක් කළ හැකිය යන්නයි.

(08) බ්‍රාහ්මණයන් විසින් තම ආධිපත්‍යය පතුරුවාලීම සඳහා යොදා ගත් ප්‍රබලතම ඉගැන්වීම වර්ණ භේදයයි. එම මතය ප්‍රතික්ෂේප කිරීමට යොදා ගත හැකි බෞද්ධ සූත්‍රධර්ම කිහිපයකි. ඒ සඳහා අදාළ නොවන්නේ,

1. වසල සූත්‍රයයි.
2. වාසෙට්ඨ සූත්‍රයයි.
3. ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
4. මධුර සූත්‍රයයි.
5. අස්සලායන සූත්‍රයයි.

(09) දානය, යාගය, හෝමය, මව, පියා, පරලොව ආදී සියල්ල ප්‍රතික්ෂේප කරමින් සතර මහා භූතයන් පමණක් ස්ථිර පදාර්ථ සේ පිළිගත් ශාස්තෘවරයා වූයේ,

1. නිගණ්ඨනාත පුත්තය.
2. පූර්ණ කස්සපය.
3. මක්ඛලී ගෝසාලය.
4. පකුධ කච්චායනය.
5. අජිත කේසකම්බලිය.

(10) බුද්ධ කාලීන භාරතයේ පැවති බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණයක් නොවූයේ,

1. අගාරික ප්‍රතිපදාව අගය කිරීමයි.
2. උපත පදනම් කරගත් සමාජ වර්ගීකරණය බැහැර කිරීමයි.
3. වේදය පරම සත්‍ය ලෙස පිළිගැනීමයි.
4. පුද්ගල ස්වාමීත්වය ස්වච්ඡන්දතාවය බැහැර කිරීමයි.
5. කාන්තාවගේ දේශපාලන, ආර්ථික, සාමාජික, ආගමික, නිදහස බැහැර කිරීමයි.

(11) බුද්ධකාලීන භාරතයේ දේශපාලන පසුබිම පිළිබඳව සඳහන් තොරතුරු අනුව සොළොස් මහා ජනපද පිළිබඳව විවිධ කරුණු අනාවරණය වෙයි. ඒ අනුව නිවැරදි ප්‍රකාශය වන්නේ,

1. රජගහනුවර අගනගරය වූ මගධය උදේන රජු පාලනය කළේ ය.
2. සැවැත් නුවර නගරය වූ කෝසල රාජ්‍යයේ ගණ තන්ත්‍ර පාලනය පැවැතියේ ය.
3. කුසිනාරාව අගනගරය වූ මල්ල රාජ්‍යයේ ගණතන්ත්‍ර පාලනය පැතියේ ය.
4. අවන්තියේ පාලකයා වූ චණ්ඩප්පජ්ජෝත රජු සප්ත අපරිහානිය ධර්ම අනුගමනය කළේ ය.
5. විශාලාව අගනගරය වූ වජ්ජි රාජ්‍යයේ රාජාණ්ඩු පාලනය පැවතියේ ය.

(12) පිණ්ඩෝල භාරද්වාජ තෙරුන් වහන්සේගෙන් ධර්මය අසා තෙරුවන් සරණ ගිය පාලකයා වන්නේ,

1. කොසොල් රජුය.
2. බිම්බිසාර රජුය.
3. විඩූඩභ රජුය.
4. උදේන රජුය.
5. චණ්ඩප්පජ්ජෝත රජුය.

(13) ශාස්වත හා අශාස්වත අන්තද්වයට නොපැමිණ සුන්දර වූ නිවනට ගිය බැවිනුත්, සුදුසු වචන නිවැරදි ආකාරයෙන් ප්‍රකාශ කළ බැවිනුත් බුදු රජාණන් වහන්සේ සතු වූ බුදුගුණය වන්නේ,

1. අරහං බුදු ගුණයයි .
2. සුගත බුදුගුණයයි.
3. ලෝක විදූ බුදු ගුණයයි
4. පුරිස දම්මසාරථී බුදුගුණයයි
5. භගවා බුදු ගුණයයි.

(14) සූනීත, සෝපාක, කිසාගෝතමී, මට්ටකුණ්ඩලී ආදීන්ගේ කතා පුවත් මගින් මනා ලෙස ප්‍රකට වන්නේ බුදුරදුන් තුළ පැවති,

1. මහා ප්‍රඥාවයි.
2. තාදී ගුණයයි.
3. මහා කරුණා ගුණයයි.
4. ආදර්ශවත් බවයි.
5. පුරිස දම්ම සාරථි ගුණයයි.

(15) බුදුරජාණන් වහන්සේ විවිධ අයුරින් ප්‍රශ්න විසඳූ ආකාරය පෙළ දහමේ සඳහන් වේ. ඒ අනුව විභජ්ජ ව්‍යාකරණීය ක්‍රමය ලෙස හඳුන්වන්නේ,

1 ඍජු පිළිතුරු සැපයීමයි.
2. ප්‍රතිප්‍රශ්න විමසා පිළිතුරු ලබාදීමයි.
3. ප්‍රශ්න පසෙකින් තැබීමයි.
4. විශ්ලේෂණාත්මකව පිළිතුරු දීමයි.
5. ශ්‍රාවකයාගේ අපේක්ෂාව අනුව දහම් දෙසීමයි.

(16) ක්‍රිපූ 6 වන සියවස වන විට භාරතීය සමාජය වාණිජකරණයට හා නාගරීකරණයට ලක්වෙමින් පැවති බවට සාධක අත. ඒ සඳහා දායක වූ ප්‍රබල පිරිසක් ලෙස හඳුනාගත හැක්කේ

1. රජවරුන්ය.
2. සිටුවරුය.
3. ඇමතිවරුය.
4. බමුණන්ය.
5. කාන්තාවන්ය.

(17) ''බුදුරජාණන් වහන්සේ අපේ මානව වෘක්ෂයේ පිපුණු මලයි. ඒ මල පිපෙන්නේ අසීමිත ලක්ෂ සංඛ්‍යාත වසර ගණනාවකට පසුවයි. එයින් වහනය වන ප්‍රඥා, සුගාන්ධයෙනුත් ඇදහැලෙන දයාව නැමති මහා මකරන්දයෙනුත් ලෝකය පිරෙයි'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ අගයීමට ලක් කළේ,

1. එඩ්වින් අර්නෝල්ඩ් විසිනි.
2. මහාචාර්ය සෝණ්ඩර්ස් විසිනි.
3. බර්ට්‍රන්ඩ් රසල් විසිනි.
4. ඇල්බට් අයින්ස්ටයින් විසිනි.
5. මැක්ස් මූලර් විසිනි.

(18) ධර්මඥානය හා අත්දැකීම් බහුලත්වය නිසා විරරාත්‍රඥ භික්ෂුණින් අතර අගතනතුර ලැබීමට හැකියාව ලැබුණේ,

1. ඛේමා තෙරණින් වහන්සේටයි.
2. පටාචාරා තෙරණින් වහන්සේටයි.
3. භද්දකච්චානා තෙරුණින් වහන්සේටයි.
4. මහා ප්‍රජාපති ගෝතමී තෙරණින් වහන්සේටයි.
5. ධම්ම දින්නා තෙරණින් වහන්සේටයි.

(19) පූර්වාරාමය නම් සුවිශේෂි ආරාමය සඟ සතුකොට බුදු සසුනට පූජා කරනු ලැබුවේ,

1. අනේපිඩු සිටුතුමා විසිනි.
2. චිත්ත ගෘහපති තුමා විසිනි.
3. නකුල මාතා විසිනි.
4. විශාඛා මහෝපාසිකාව විසිනි.
5. කොසොල් රජු විසිනි.

(20) අත්තකාර, පරකාර, ආරම්භධාතු, නික්ඛමධාතු, පරක්කම ධාතු, උපක්කම ධාතු, යන ඉගැන්වීම් මගින් අර්ථවත් කරන්නේ,

1. පුද්ගල ශක්තියයි.
2. පුද්ගල යුතුකම්ය.
3. පුද්ගල චරිත ලක්ෂණයි.
4. පුද්ගල විමුක්තියයි.
5. පුද්ගල විවිධත්වයයි.

(21) සමාජ ප්‍රභවය හා විකාශය පටිච්චසමුප්පාද මූලධර්ම මත සිදු වූ බව දීඝනිකායේ අග්ගඤ්ඤ සූත්‍රයෙන් පෙනේ. ඒ සඳහා පාරිසාරික, ආර්ථික, දේශපාලනික, ආචාර විද්‍යාත්මක, මෙන්ම මනෝ විද්‍යාත්මක සාධක බලපාඇති අතර පුද්ගලයා විසින් සිය ගැටලුවලට විසඳුම් සෙවීමේ ප්‍රතිඵලයක් ලෙස විවිධ සමාජ සංස්ථා බිහි වී ඇත. එමගින් ගම්‍ය වන්නේ,

1. සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය උපත අනුව සිදු වූ බවයි.
2. ප්‍රසිද්ධියේ රාගිකව හැසිරීම පාලකයන්ගේ අප්‍රසාදයට හේතු වූ බවයි.
3. දේපල සන්නිධිකරණය නිසා බොහෝ ගැටලු ඇති වූ බවයි.
4. සමාජය විකාශයේ දී තණ්හාව මූලික වී ඇති වූ ක්‍රියාකාරකම් බෙහෝ ගැටලු සඳහා හේතු වූ බවයි.
5. රාජ්‍ය පාලකයා දෙවියන්ගේ අනු දැනුම මත බිහි වූ බවයි.

(22) කොසෙල් රට හිමවත් ප්‍රදේශයේ දී ''නො නසමින් නොනස්වමින් නොදිනමින් නො දිනවමින් ශෝක නොකරමින් ශෝක නොකරවමින් දැහැමින් රාජ්‍ය පාලනය කළ හැකි'' ද යනුවෙන් කල්පනා කළ බවට තොරතුරු මාර සංයුක්තයේ රජ්ජ සූත්‍රයේ සඳහන් වේ. එසේ කල්පනා කළේ,

1. කොසෙල් රජුය.
2. සැරියුත් තෙරුන් වහන්සේය.
3. බිම්බිසාර රජුය.
4. ආනන්ද තෙරුන් වහන්සේය.
5. බුදුරජාණන් වහන්සේය.

(23) රාජ්‍ය පාලකයා ප්‍රජා සුභසාධනය තුළින් ප්‍රජා අවශ්‍යතා ඉටු කළ යුතු බවත් අගතිගාමී නොවී අවංකව ක්‍රියා කළ යුතු බවත් පවිටු සිතිවිලි, වලට වහල් නොවී ඉන්ද්‍රිය දමනයෙන් යුතුව ක්‍රියා කළ යුතු බවත් මහජනයාට හිංසා පීඩා නොකර සහයෝගයෙන් ක්‍රියා කළ යුතු බවත්, බෞද්ධ දේශපාලන මූලධර්ම තුළින් පෙන්වා දෙයි. මේ ආකල්ප වඩාත් තහවුරු කරන්නේ,

1. දස සක්විතිවත් තුළිනි.
2. සතර සංග්‍රහ වස්තුව තුළිනි.
3. දස රාජ ධර්ම තුළිනි.
4. පංචසීල ප්‍රතිපත්තිය තුළිනි.
5. සප්ත අපරිහානිය ධර්ම තුළිනි.

(24) සප්තාර්ය ධනයට ඇතුළත් නොවන පදයක් ඇතුළත් වර්ණය වන්නේ,

1. සද්ධා, සීල, චාග, පඤ්ඤා.
2. සද්ධා, සීල, හිරි, ඔත්තප්ප.
3. සද්ධා, සීල, සුත, චාග.
4. සද්ධා, සිල, ඔත්තප්ප, පඤ්ඤා.
5. සද්ධා, සීල, සමාධි, පඤ්ඤා.

(25) සම්බුදු සසුනට අනුග්‍රහය ලබාදෙමින් බුද්ධ කාලයේ විසූ සිවුවනක් පිරිසෙහිම සාමාජිකයන්ට විවිධ තනතුරු හිමි විය. ඒ අනුව ධර්ම කථික උපාසකයන් අතර අතර අග්‍ර වූයේ,

1. අනේපිඬු සිටුතුමාය.
2. චිත්ත ගෘහපති තුමාය.
3. බිම්බිසාර රජුය.
4. නකුල පිතාය.
5. ධම්මික උපාසක තුමාය.

(26) සාර්ථක රාජ්‍ය පාලකයකු වීමට අවශ්‍ය සුදුසුකම් අතර, මවුපිය දෙපසින් අභිජාත පිළිගත් තැනැත්තකු වීම. මනා දැන උගත් කමකින් යුක්ත වීම, සිල්වත් වීම, ශ්‍රද්ධාවන්ත දානපතියෙකු වීම, නුවනැත්තකු වීම, රාජ්‍යය තුළ අපරාධ වලක්වා ආර්ථිකය සංවර්ධනය කරන්නකු වීම, යනාදී කරුණු ඇතුළත් දේශපාලන මූලධර්මයන් පෙන්වා දී ඇත්තේ,

1. කලාම සූත්‍රයේ ය.
2. චක්කවත්තිසීහනාද සූත්‍රයේ ය.
3. මහාපරිනිබ්බාන සූත්‍රයේය.
4. කූටදන්ත සූත්‍රයේ ය.
5. වාසෙට්ඨ සූත්‍රයේය.

(27) සීලවතී උපාසිකාව තමා කිසිවකුට වරදක් නොකරන බවත්, ඉතා සිල්වත්ව වාසය කරන බවත් නිතර පවසන්නීය. සතර පෝයටම අටසිල් සමාදන් වන ඇය, සියල්ලන්ටම කලින් පන්සලට ගොස් මළුපෙත්මං ඇමදීම ද සිදු කරයි. බුද්ධ පූජාව පවත්වා ටික වේලාවක් භාවනා කිරීමෙන් පසු විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේට දානය පූජා කිරීම ද ඇයගේ පුරුද්දකි. සන්ධ්‍යාවෙහි ධර්ම දේශනාවට මැනවින් සවන් දීමත් ඒ සියල්ල අවසානයේදී මියගිය ඥාතින් සිහිපත් කරමින් පින් අනුමෝදන් කිරීමත් ඇය අනිවාර්යයෙන් සිදුකළ කටයුත්තකි. ඇයගේ මෙම ක්‍රියාදාමය සියලු දෙනාගේම ප්‍රසංසාවට ලක්විය. මෙම ප්‍රකාශය අනුව ඇයගෙන් ඉටු වී ඇත්තේ දස පුණ්‍ය ක්‍රියාවන්ගෙන්,

1. පහකි.
2. හයකි.
3. හතකි.
4. අටකි.
5. නවයකි.

(28) බෞද්ධ මූලාශ්‍රවල සඳහන් ''භෝග සුඛය'' යන්න නිවැරදිව අර්ථ කථනය කරන්නේ නම්,

1. සධාරණව උපයා ගත් වස්තුව තමා සතු බව සිතීමයි.
2. ණය වීමෙන් තොරව උපයන ලද බොහෝ වස්තූන් තමා සතුව ඇතැයි සතුටු වීමයි.
3. තමා සතු භව බෝග සම්පත් අනුන්ට පරිත්‍යාග කිරීමෙන් ලබන සතුටයි.
4. පරම්පරාවෙන් උරුම වූ සම්පත් තමා සතු යැයි සතුටු වීමයි.
5. උපයාගත් ධනය මැනවින් පරිභෝග කිරීමෙන් ලබන සතුටයි.

(29) යමෙක් දැහැමි වූත් ශිෂ්ට සම්පන්න වූත් මානසික තෘප්තියක් ලබන්නේ නම් එය බුදු දහමෙහි සඳහන් කරන්නේ,

1. සන්තුෂ්ටිතාව නමිනි.
2. අල්පේච්ඡතාවය නමිනි.
3. සුභරතාවය නමිනි.
4. ඔත්තප්ප නමිනි.
5. අප්පකිච්චතා නමිනි.

(30) ''භාග්‍යවතුන් වහන්ස, කිඹුල්වත්පුරයේ මඟ දෙපස ඇති මනරම් මහා වෘක්ෂයන්හි පරණ කොළ හැලී ගිනි අඟරු මෙන් රත්පැහැති දළු ඇත. භාග්‍යවතුන් වහන්ස, කිඹුල්වත්පුරයේ දේශගුණය යහපත්ය. සීතල ද අධික නැත. උෂ්ණත්වය ද අධික නැත. ඍතුව යහපත්ය. වීරයන් වහන්ස මෙය නික්ම යාමට සුදුසුම කාලයයි.'' යනුවෙන් ප්‍රකාශ කළේ,

1. ආනන්ද තෙරුන් වහන්සේය.
2. මහා කාශ්‍යප තෙරුන් වහන්සේය.
3. මුගලන් තෙරුන් වහන්සේය.
4. සැරියුත් තෙරුන් වහන්සේය.
5. කාළුදායි තෙරුන් වහන්සේය.

(31) දිළිඳු කම කාමභෝගී ගිහියාට දුකකි. ගිහි ජීවිතයේ සාර්ථකත්වය සඳහා ආර්ථික සමෘද්ධියෙහි වැදගත්කම බුදුසමය අවධාරණය කරයි. එසේම සාධාරණව උපයන ධනය විසර්ජනය කළ යුතු ආකාරය ද විග්‍රහ කර ඇත. ඒ අතර තමා මෙන්ම මවුපිය, අඹුදරු, සේවක සේවකාදීන්, සැපවත් කිරීම පිණිස ධනය හරිහරණය කළ යුතු බව ඍජුව දේශනා කරන සූත්‍ර ධර්ම දෙකක් වනුයේ,

1. මහාමංගල සූත්‍රය හා පරාභව සූත්‍රයයි.
2. මධුර සූත්‍රය හා කූටදන්ත සූත්‍රයයි.
3. පත්තකම්ම සූත්‍රය හා අපුත්තක සූත්‍රයයි.
4. පත්තකම්ම සූත්‍රය හා ව්‍යග්ඝපජ්ජ සූත්‍රයයි.
5. ව්‍යග්ඝපජ්ජ සූත්‍රය හා සිගාලෝවාද සූත්‍රයයි.

(32) ''සච්චේන අලිකවාදිනං'' යන ගාථා පදයෙන් පෙන්වා දෙන ධර්මෝප දේශය නම්,

1. බොරුකියන්නා සත්‍යයෙන් දිනිය යුතු යන්නයි.
2. ක්‍රෝධකරන්නා ක්‍රෝධ නොකිරීමෙන් දිනිය යුතුය යන්නයි.
3. අසත් පුරුෂයා සත් පුරුෂ කමෙන් දිනිය යුතුය යන්නයි.
4. මසුරුකම ත්‍යාගයෙන් දිනිය යුතුය යන්නයි.
5. අයහපත යහපතින් ජයගත යුතුය යන්නයි.

(33) ''මධුවා මඤ්ඤතී බාලෝ - යාව පාපං න පච්චති
යදාච පච්චතීපාපං - අථබාලෝ දුක්ඛං නිගච්ඡති''
යන ධම්මපද ගාථාවෙන් අදහස් වන්නේ,

1. පව්ටු මිතුරන් ඇසුරු නොකළ යුතු බවයි.
2. අනුන් ගැන නොසොයා තමන් ගැන සෙවිය යුතු බවයි.
3. මෝඩයා තමා කළ පව්, විපාක දෙන තෙක් එය මී පැණි මෙන් සලකන බවයි.
4. පව් කරන්නා මෙලොවත් පරලොවත් තැවෙන බවයි.
5. ආශාව නිසා ශෝකය හටගන්නා බවයි.

(34) බුදුරජාණන් වහන්සේගෙන් එක්තරා දේවතාවකු පුද්ගලයාගේ පිරිහීමට හේතුවන කරුණු මොනවාදැයි යනුවෙන් අසන ලද ප්‍රශ්නවලට පිළිතුරු ලෙස පරාභව සූත්‍රය දේශනා කරන ලදී. එහි ඇතුළත් පිරිහීමේ කරුණක් නොවන්නේ,

1. ධර්මයට ද්වේශකිරීම.
2. අසත් පුරුෂයන් ප්‍රිය කිරීම.
3. නිතර නිදන සුළු බව.
4. නොකල්හි වීථි සංචාරය.
5. සුදු වෙහි ලොල් වීම.

(35) බුදු රජාණන් වහන්සේ ලක්දිව මහවැලි ගංගා තලාවේ මහියංගණයට වැඩම කොට එහි මහා නාග වනෝද්‍යානයේ දී යක්ෂයන් වෙනුවෙන් ධර්ම දේශනා කළ බව සඳහන් වේ. එම සිදුවීම සිදුවූයේ,

1. වෙසක් පුන් පොහෝ දිනක දීය.
2. දුරුතු පුන් පොහෝ දිනකදීය.
3. ඇසළ පුන් පොහෝ දිනක දීය.
4. වප් පුන් පොහෝ දිනකදී ය.
5. උඳුවප් පුන් පොහෝ දිනක දී ය.

(36) බුදු සමයේ විශේෂ ලක්ෂණයක් වන්නේ සුදුස්සාට සුදුසුතැන ලබාදීමයි. අග තනතුරු ප්‍රදානය කිරීම. ඒ අනුව සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස ධූතාංගධාරීන් අතර අගතනතුර හිමිවූයේ,

1. කොණ්ඩඤ්ඤ මහරහතන් වහන්සේටය.
2. සැරියුත් මහරහතන් වහන්සේටය.
3. මුගලන් මහරහතන් වහන්සේටය.
4. මහාකාශ්‍යප මහරහතන් වහන්සේටය.
5. අස්සජි මහරහතන් වහන්සේටය.

(37) සිගාලෝවාද සූත්‍රයට අනුව උතුරු දිශාව හා බටහිර දිශාව නියෝජනය කරන්නේ,

1. ගුරුවරු හා දෙමාපියෝය.
2. දෙමාපියෝ හා අඹුදරුවෝය.
3. අඹුදරුවෝ හා දැසි දස්සෝය.
4. දැසිදස්සෝ හා මිත්‍රයෝය.
5. මිත්‍රයෝ හා අඹුදරුවෝය.

(38) සතර බ්‍රහ්ම විහරණ ''අප්පමඤ්ඤා,'' නමින් හඳුන්වනු ලබයි එසේ හඳුන්වන්නේ,

1. දෙමාපියන් තුළ පවතින ගුණ ධර්මයන් බැවිනි.
2. සීමාවකින් තොරව වැඩිය යුතු බැවිනි.
3. බුදුරජාණන් වහන්සේ තුළ පැවති ගුණයක් බැවිනි.
4. අප්‍රමාදීව වැඩිය යුතු ගුණ ධර්ම බැවිනි.
5. මෙම ගුණධර්ම නොමැති විට පසුතැවීමට සිදුවන බැවිනි.

(39) දේවවාදී ආගමික විශ්වාසය අනුව කටයුතු කරන පුද්ගලයන්ට ඇති වන මනෝභාවය භක්තියයි. එහෙත් බෞද්ධයාට දැකීමෙන් හා දැන ගැනීමෙන් ඇතිවන මනෝභාවය ශ්‍රද්ධාවයි. බුදු දහමේ ඉගැන්වෙන ශ්‍රද්ධාව පිළිබඳ විමර්ශනය කරන විට ඒ පිළිබඳ වැරදි මතයක් වන්නේ,

1. ශ්‍රද්ධාව දැඩිව අවශ්‍ය වන්නේ රහත් වීමෙන් පසුව බවයි.
2. බෞද්ධ විමුක්ති මගෙහි ආරම්භය ශ්‍රද්ධාව විය යුතු බවයි.
3. ශ්‍රද්ධාවන්තයා ධර්මය අසන බවයි.
4. දෘෂ්ටිය නැමැති ඕඝය තරනය කරන්නේ ශ්‍රද්ධාවෙන් බවයි.
5. ශ්‍රද්ධාව නම් තෙරුවන් කෙරෙහි අවබෝධයෙන් ඇති වන පැහැදීම බවයි.

(40) පන්සිල් හා අටසිල් පිළිබඳ අධ්‍යයනය කරන විට එළඹිය හැකි නිගමන අතරින් සාවද්‍ය නිගමනය විය යුත්තේ,

1. පංචසීලය, ගේහසිබ, සීලය නමින් හැඳින්විය හැකිය.
2. පන්සිල් හා අටසිල්වල ශික්ෂාපද හතරක් සමානය.
3. පන්සිල් සුරැකීම මඟින් මානව අයිතීන් සුරක්ෂිත වෙයි.
4. අෂ්ටාංග සීලය අධ්‍යාත්මික සංවර්ධනය පිණිස හේතු වෙයි.
5. අෂ්ටාංග සීලයට වඩා වේගයෙන් පුද්ගලයා නිවනට යොමු කරන්නේ පංචසීලය තුළිනි.

(41) යම් ආයතනයක සාර්ථකත්වය සඳහා කළමනාකරණය බෙහෙවින් වැදගත්ය. බුදුරජාණන් වහන්සේ ද සියලු කටයුතු කළමනාකරණය කළ බව ඉතා පැහැදිලිය. භෞතික සම්පත් මැනවින් කළමනාකරණය කිරීම සඳහා ද විවිධ තනතුරු භික්ෂූන් වෙත පවරා තිබුණි. ඒ අනුව ''සිව භාජක'' නමින් හඳුන්වනු ලැබුවේ,

1. ආහාර බෙදන්නාය
2. කැඳ බෙදන්නාය
3. ධාන්‍ය බෙදන්නාය
4. පාත්‍ර බෙදන්නාය
5. පළතුරු බෙදන්නාය

(42) සෞන්දර්ය රසාස්වාදය බුදුදහමින් ප්‍රතික්ෂේප කර නැත. බුදුරදුන් ද පරිසර සෞන්දර්ය අගය කළ අවස්ථා ඇත. ඒ සඳහා නිදසුනක් වන්නේ,

1. උග්ගසේන නම් කරණම්කරුගේ දක්ෂතා අගය කිරීම
2. සප්පක තෙරුන් අජකරණී නදිය අසල සුන්දරත්වය අගය කිරීම
3. සත්තම්බක චෛතිය, බහුපුත්තක චෛතිය, සරන්දද චෛතිය, චාපාල චෛතිය ආදී ස්ථානවල සුන්දරත්වය අගය කිරීම
4. පංච සිඛගේ වීණා වාදනය අගය කිරීම
5. ප්‍රථම රහත් හැට නම ධර්ම ප්‍රචාරයේ යෙදවීම.

(43) ශාසන ඉතිහාසයෙහි දෙවන ධර්ම සංගීතිය නිකාය භේදයකට ද මුල පිරූ අතර විවිධ ප්‍රතිඵල ගෙන දීමට හේතු විය. ඒ අතර එමගින් සිදු වූ විශේෂ ප්‍රතිඵලයක් වන්නේ,

1. ධර්ම විනය මුඛ පරපුරින් පවත්වාගෙන යාම සඳහා භාණක භික්ෂූන් වෙත පැවරීම
2. බුදු සසුනේ උන්නතිය සඳහා විදේශීය ධර්ම ප්‍රචාරය ඇරඹීම.
3. අභිධර්ම පිටකය අංග සම්පූර්ණ කිරීම.
4. ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩය දීමට තීරණය කිරීම.
5. දස දහසක් භික්ෂූන් අලජ්ජී පාපී භික්ෂූන් ලෙස නිගමනය කර සසුනෙන් නෙරපීම.

(44) ධර්මාශෝක රාජ්‍ය සමය වනවිට ශාසනික වශයෙන් අර්බුදකාරී තත්ත්වයක් උදා විය. ලාභ සත්කාරයෙන් ගිජු වූ බොහෝ අන්‍ය තීර්ථකයන් පොහොය විනය කර්මය පවා නතර විය. පොහොය විනය කර්ම නතර වීමට ප්‍රධාන හේතුවක් වූයේ,

1. දුස්සීල භික්ෂූන් වැඩිවීමයි
2. රාජ්‍ය අනුග්‍රහය නොලැබීමයි
3. පොහොය සීමා නොතිබීමයි.
4. ධර්මය දත් භික්ෂූන් නොසිටීමයි
5. අන්‍ය ආගමික මතවාද ප්‍රචලිත වීමයි.

(45) මහා මිනිස් ඝාතන නිසා දැඩි කම්පාවට හා කළකිරීමට පත් අශෝක රජු දිග්විජය ප්‍රතිපත්තිය අතහැර ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කරන්නට පෙළඹුන බව සඳහන් වන්නේ,

1. ගර්නාර් ගිරි ලිපියේය.
2. කාල්සි ගිරි ලිපියේය.
3. දහතුන් වන ගිරි ලිපියේය.
4. නව වන ගිරි ලිපියේය.
5. තුන්වන ගිරි ලිපියේය.

(46) භාරතයෙහි පැවති විශ්ව විද්‍යාල අතර නාලන්දා විශ්ව විද්‍යාලයට විශේෂ ස්ථානයක් හිමිවිය. එම ආයතනයට අවශ්‍ය ගොඩනැගිලි පහසුකම් ඇති කොට උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් බවට පත් කිරීමේ ගෞරවය හිමිවන්නේ,

1. ධර්මපාල රජතුමාටය.
2. වික්‍රමාත්‍ය රජතුමාටය.
3. බාලා දිත්‍ය රජතුමාටය.
4. ශක්‍රා දිත්‍ය (කුමාරගුප්ත) රජතුමාටය.
5. බුද්ධ ගුප්ත රජතුමාටය.

(47) ක්‍රි: ව: 7 වන සියවසේ භාරතයෙහි සංචාරය කළ හියුං සියැං තෙරුන්ගේ වාර්තා අනුව සංඝාරාම 100 ක් හා භික්ෂූන් වහන්සේලා 6000 කට වැඩ සිටීමට නේවාසික පහසුකම් තිබූ බව සඳහන් කරන්නේ,

1. නාලන්දා විශ්ව විද්‍යාලයේය.
2. වික්‍රමශිල විශ්වවිද්‍යාලයේය.
3. වලභි විශ්වවිද්‍යාලයේය.
4. තක්ෂිලා විශ්වවිද්‍යාලයේය.
5. ජගද්දලා විශ්වවිද්‍යාලයේය.

(48) ප්‍රාග් බෞද්ධ ලංකාවේ විවිධ ඇදහිලි හා විශ්වාස පැවති බවට තොරතුරු මහාවංසාදී මූලාශ්‍රවල සඳහන් වේ. එම යුගයේ දී දඩයම්කරුගේ දෙවියන් සේ සලකා එක් දෙවියකු වෙනුවෙන් තල්ගස වෙන් කර තිබුණි. එම දෙවියානම්,

1. කම්මාර දෙවියාය.
2. ව්‍යාධ දෙවියාය.
3. වෛශ්‍රවණ දෙවියාය.
4. ධෘතරාෂ්ට්‍ර දෙවියාය.
5. විභීෂණ දෙවියාය.

(49) ෆාහියන් හිමියන්ගේ වාර්තා අනුව ලක්දිව අභයගිරි විහාරය අන්තර්ජාතික බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස ප්‍රකට විය. එම ආයතනය ශාසනික ගැටලු උද්ගත වීමට ද මූලික විය. එහි ප්‍රයෝජනය වෙනුවෙන් ''ගාමිණී තිස්ස'' නමින් ජලාශයක් තනවන ලද බව ද සඳහන් වේ. එම කටයුත්ත සිදු කළේ,

1. වළගම්බා රජුය.
2. සිරි මෙවන්රජුය.
3. දුටුගැමුණු රජුය.
4. තිස්ස රජුය.
5. ගජබා රජුය.

(50) කුශාන වංශ පරම්පරාවෙන් පැවත ද්විතීය ධර්මාශෝක නමින්ද ප්‍රකට වූ කණිෂ්ක රජු සිවුවන ධර්ම සංගීතයට අනුග්‍රහ දැක්විය. කාශ්මීරයේ කුණ්ඩලවන විහාරයේ දී පැවති එම සංගීතිය සඳහා සභාපතිත්වය දරනු ලැබුවේ,

1. පාර්ශ්ව තෙරුන්ය.
2. අශ්වඝෝෂරුන්ය.
3. නාගර්ජුන තෙරුන්ය.
4. වසුමිත්‍ර තෙරුන්ය.
5. ශිලභද්‍ර තෙරුන්ය.

The National e-learning Portal for The General Education